**ශීර්ෂය - 16 පාර්ලිමේන්තුව**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්වාගණනය කළ මතය

පාර්ලිමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 7 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පාර්ලිමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තුව විසින් නියමිත දිනයට පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය** | | |
| විෂයය අංක 01601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 02 1/2 ක ප්‍රමාදයකින් පසුව 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | මින් ඉදිරියට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම ප්‍රමාදයකින් තොරව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ තුළ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-එෆ් ආකෘතියේ ඉදිරිපත් කර තිබූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වම්පස තිරුවෙහි දක්වා තිබූ 2018 වර්ෂයේ අයවැය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වේ. | විසර්ජන ගිණුම 2018 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු බැවින් මූලික කටයුතු වලට හානි නොවන සේ සත්‍ය වියදම් ඇතුළත් කර විසර්ජන ගිණුම සකස් කර |

| | | | |
|---|---|---|---|
| | සංඛ්‍යාත්මක අගයන් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයයන් අතර වියදම් අයිතමයන් 07 ක අගයයන් වැඩියෙන්ද, වියදම් අයිතමයක අගය අඩුවෙන්ද නිරූපණය කර තිබුණි. | | ඇත. එහෙත් ඇස්තමේන්තු අගය සඳහන් කිරීමේදී සඳහන් කර ඇති අගය වෙනස් වී ඇත. ඉදිරියේදී නිවැරදිව සටහන් කිරීමට බලාපොරොත්තු වේ. |
| (ආ) | රජයේ දේපලකට වූ හානියක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නොහැකි අවස්ථාවකදී පමණක් මුදල් රෙගුලාසි 109 දක්වා වූ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල පොත් වලින් කපාහැරීමේ ප්‍රකාශයෙහි ඇතුළත් කල යුතු වුවත්, 2018 නොවැම්බර් මසදී පාර්ලිමේන්තු සභා ගර්භයේ ඇති වූ නොසන්සුන්තාවය හේතුවෙන් සිදුවූ රු.374,628 ක අලාභය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොත් වලින් කපාහැරීමේ ප්‍රකාශනයෙහි ඇතුළත් කිරීම වෙනුවට පාඩු හා අත්හැරීම් ප්‍රකාශයෙහි ඇතුළත් කර තිබුණි. තවද ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පිළියෙල කළ යුතු පොදු 283, 284 හා 285 වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හඳුන්වා දී ඇති ආකෘතින්වල තොරතුරු ඇතුළත් කළයුතු වේ. | උපකරණ සඳහා වන අලාභය සඳහා රක්ෂණ වන්දි අපේක්ෂා කරන බැවින් එම අලාභය පාඩු හෝ අත්හැරීම් ලේඛණයේ ඇතුළත් කළ නොහැක. තවද මෙය අධිකරණමය ක්‍රියාමාර්ගවලට යොමුවීම හේතුවෙන් එම අලාභ වූ උපකරණ නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් මෙතෙක් අවසන් තීරණයක් ගෙන නොමැති බවත් සඳහන් කරමි. |

**1.6.3 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) **ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඒසීඒ-එෆ් ආකෘතිය යටතේ වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාරයේ අග්‍රිම ලැබීම් ලෙස රු.2,538,700,000 ක වටිනාකමක් ඇතුළත් කර ඇති නමුත්, | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හඳුන්වා දී ඇති ආකෘතින් අනුව මූල්‍ය ප්‍රකාශන වල අගයයන් හා | 2018 වර්ෂයේ සිට හඳුන්වාදී ඇති ආකෘති පත්‍ර පිළියෙල කිරීමේ පැහැදිලි උපදෙස් අදාල චක්‍රලේඛ සමග ඉදිරිපත් කර නොමැත. කෙසේ වෙතත් ඉදිරියේදී එම කරුණ නිවැරදිව |

| | | |
|---|---|---|
| එදිනට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරයේ අග්‍රිම ලැබීම්, ආදායම් නොවන ලැබීම් යටතේ ඇතුළත් නොකර ප්‍රදානයන් ලැබීම් ලෙස දක්වා තිබුණි. | තොරතුරු ඇතුළත් කළයුතු වේ. | සටහන් කිරීම අපේක්ෂා කරමි. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය අනුව දේපළ පිරියත හා උපකරණ වල අගය රු.8,816,905,074 ක් වූ නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම අගය දෙගුණයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ, මුළු වත්කම් හා මුළු වගකීම් වල අගය රු.8,816,905,074 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හඳුන්වා දී ඇති ආකෘතින් අනුව මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | වැරදීමකින් දේපල වත්කම් සහ පිරියත සංඛ්‍යාව ගණන් කිරීමේදී මෙම වරද සිදුවී ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට බලාපොරොත්තු වේ. |
| **(ii)** | පාර්ලිමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි කිහිපයක් තක්සේරු කර ගිණුම් ගතකිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | 2013 ජනවාරි 24 දිනැති අංක එස්ඒ/ඒඑස්/ඒඒ/චක්‍රලේඛ දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3 ඡේදයෙහි සඳහන් පරිදි ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළයුතු වේ. | මාදිවල නිවාස සංකීර්ණය, නුවරඑළියේ සෙන්පති මැදුර, ජයවඩනගම නිවාස හා ඒවාට අයත් ඉඩම් වල අගය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. හැකි ඉක්මණින් තක්සේරු කරවා ගැනීම පිණිස සිහි කැඳවීම් ලිපි යවා ඇත. තක්සේරුව ලද විගස ගිණුම් ගත කරනු ඇත. |
| **(iii)** | පාර්ලිමේන්තුව සතු වත්කම් නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමේදී ඇතිවී තිබූ රු.119,937,371 ක වත්කම්වල අගය වෙනස්වීම, සමාලෝචිත | වත්කම් නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමේදී මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනස්කම් යටතේ (අගය වෙනස්වීමේ ලාභ/අලාභ) ගැලපීම් සිදු කළයුතු වේ. | නව ආකෘතිය යටතේ ක්ෂේත අංක වලට ගැලපෙන ලෙස විසර්ජන ගිණුමට ගැලපීමේදී අපහරණ තිරුවේ සටහන් කර තිබුණත් ආකෘතියේ පහළ කොටසේ ඒ වෙනුවෙන් පැහැදිලි කිරීම සටහනක් තබා |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනස්කම් යටතේ (අගය වෙනස්වීමේ ලාභ/අලාභ) ගැලපීම් සිදු නොකර අපහරණයන් (මාරුකිරීම්) යටතේ ගලපා තිබුණි. | | ඇත. |
| **(iv)** | පාර්ලිමේන්තුව සතු වාහන තක්සේරු කර ගිණුම් ගත කිරීමේදී ඇතිවී තිබූ රු.223,232,620 ක වත්කම්වල අගය වෙනස්වීම, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනස්කම් යටතේ (අගය වෙනස්වීමේ ලාභ/අලාභ) ගැලපීම් සිදු නොකර අත්පත් කර ගැනීම් යටතේ මාරු කිරීම් ලෙස (අනෙකුත් ආයතන වලින්) යටතේ ගලපා තිබුණි. | වත්කම් නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමේදී මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනස්කම් යටතේ (අගය වෙනස්වීමේ ලාභ/අලාභ) ගැලපීම් සිදු කළයුතු වේ. | ඒසීඒ 6 ආකෘතියේ පහල කොටසේ විශේෂ පැහැදිලි කිරීම් සටහනක් මෙම වාහන වල අගය වෙනස් වීම පිළිබඳ තබා ඇත. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.3,175,733 ක් වූ අතර, එයින් රු.1,321,379 ක හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 23 ක කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ඡේදයේ සඳහන් විධිවිධාන, ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති වලට යොමු දැක්වූ ඉහත චක්‍රලේඛයේ 8 ඡේදය සඳහා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළයුතු වේ. | අයවිය යුතු මුළු ණය ශේෂය රු.3,175,733.12 ක් යන අගයෙන් රු.1,321,378.76 ක හිගහිටි ශේෂ වර්ෂ 01 ට වැඩි කාල පරාසයක සිට පවතී. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුමේ හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.166,314 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂ සසඳා අවශ්‍ය නිවැරදි කිරීම් කළයුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුමේ හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර වෙනස ඉදිරි කාලයේදී සැසඳීමට කටයුතු කරනු ලැබේ. |

**(ඇ) අග්‍රිම ශේෂය**

-------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | --------------------- | ----------- | ---------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ඒසීඒ-එෆ් ආකෘතිය) ඇතුළත් 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය හා භාණ්ඩාගාර අග්‍රිම ශේෂය අතර වෙනස සැසඳීම සඳහා පිළියෙල කර තිබූ ගැලපුම් ගිණුමෙහි ඇති වී තිබුණු රු.3,164,525 ක වෙනස මූල්‍ය ප්‍රකාශනවල අග්‍රිම ගිණුම සඳහා පිළියෙල කර තිබූ ඒසීඒ - 3 ආකෘතියෙහි 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයෙහි එකතු තීරය යටතේ දක්වා තිබුණි. එම වෙනස පාර්ලිමේන්තු වැය ශීර්ෂය යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරා තිබූ රු.3,164,525 ක වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | අග්‍රිම ශේෂය නිසි පරිදි සැසඳීම් කර ඇත. එහෙත් එම ආකෘති පත්‍ර වල සංඛ්‍යාත්මක දත්ත පිළිබඳ උපදෙස් ලබා දී ඇතත්, පැහැදිලි මග පෙන්වීමක් සිදු කර නොමැති බැවින් මේ පිළිබඳ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙතින් දුරකතනයෙන් විමසා සිටියද නිශ්චිත පිළිතුරක් ලබා ගත නොහැකි විය. අදාල සිද්ධාන්ත වලට හානි නොවන සේ ලේඛන පිළියෙල කර ඇත. |
| (ii) | 2018 වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.2,538,700,000 ක් වුවත්, එම අගයට රු.47,581,736 ක වෙනත් ලැබීම් එකතු කර, අග්‍රිම ලැබීම් රු.2,586,281,736 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 3 ආකෘතියෙහි දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශ 2018 චක්‍රලේඛයේ 07 (ii) යටතේ දක්වා ඇති උපදෙස් අනුව භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ලෙස සලකා ඒසීඒ 03 ආකෘතියට ඇතුළත් කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් රු.40,188,320 ක් වුවත්, එම අගය රු.5,763,246 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 3 ආකෘතියෙහි | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශ 2018 චක්‍රලේඛයේ 07 (v) යටතේ ශුද්ධ වත්කම් ගණනය කිරීම මගින් ඇතිවන අග්‍රිම සැසඳීමේදී එන රු.5,763,246 |

| | | | |
|---|---|---|---|
| | දක්වා තිබුණි. | | අගය ඇතුළත් කර ඇත. |
| (iv) | 2018 වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.2,538,700,000 ක් සහ වෙනත් මූලාශ්‍ර වලින් ලැබීම් රු.40,188,320 ක් ලෙස අග්‍රිම ලැබීම්වල මුළු එකතුව රු.2,578,888,320 ක් විය. එම අගය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සමාන වී තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 3 ආකෘතියෙහි එම අගය රු.2,592,044,982 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශ 2018 චක්‍රලේඛයේ 07 (v) යටතේ ගණනය කිරීම් අනුව ඇතිවන අගය වෙනත් මූලාශ්‍ර යටතේ ඇතුළත් කිරීමෙන් එකී වෙනස ඇතුළත් වී තිබුණි. |
| (v) | 2018 වර්ෂය තුළ වියදම් මඟින් රු.2,578,882,815 ක අග්‍රිම පියවා තිබුණු අතර, එම අගය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සමාන වී තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 3 ආකෘතියෙහි වියදම් මඟින් අග්‍රිම පියවීම රු.2,588,874,950 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශ 2018 චක්‍රලේඛයේ 07 (v) යටතේ ගණනය කිරීම් අනුව ඇතිවන අගය වෙනත් මූලාශ්‍ර යටතේ ඇතුළත් කිරීමෙන් එකී වෙනස ඇතුළත් වී තිබුණි. |
| (vi) | සමාලෝචිත වර්ෂය තුළ වියදම් මඟින් සහ මුදල් මඟින් අග්‍රිම පියවීම වල මුළු එකතුව රු.2,578,888,320 ක් වුවද, එම අගය මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 3 ආකෘතියෙහි රු.2,588,880,455 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි අගයන් ඇතුළත් කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශ 2018 චක්‍රලේඛයේ 07 (v) යටතේ ගණනය කිරීම් අනුව ඇතිවන අගය වෙනත් මූලාශ්‍ර යටතේ ඇතුළත් කිරීමෙන් එකී වෙනස ඇතුළත් වී තිබුණි. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පාර්ලිමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **බඩු ලේඛන පොත** | | |
| මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව බඩු | මුදල් රෙගුලාසි | පාර්ලිමේන්තු සංකීර්ණය තුළ |

| | | |
|---|---|---|
| ලේඛන පොත යාවත්කාලීන කර නොතිබුණි. | 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොත් යාවත්කාලීන කර පවත්වා ගතයුතු වේ. | පිහිටා ඇති ආයතනවල පාර්ලිමේන්තුව නියෝජනය කරමින් නිලධාරීයෙකු නොසිටින හෙයින් ප්‍රායෝගිකව ඉන්වෙන්ට්‍රි පොත් යාවත්කාලීන වීමක් සිදු නොවේ. |

**(ඊ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්**,** වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව එක් විගණන විමසුමකට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2019 පෙබරවාරි 27 දිනැති හා අංක 1**A/22/XXII** දරන අධ්‍යක්ෂ (මුදල්) ගේ ලිපිය මගින් විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීමට මාස තුනක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. |

**(උ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| | XXIV වැනි පරිච්ඡේදයේ 3.5 | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව යම් නිලධාරීයෙකුගේ | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2017 වර්ෂයේ සිට පඩි ලැයිස්තුවෙන් මාසික අඩුකිරීම්වල එකතුව |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තිය | මාසික පඩි ලැයිස්තුවෙන් අඩු කිරීම්වල එකතුව වැටුපෙන් සියයට 40 කට නොවැඩි විය යුතු වුවත්, 2018 නොවැම්බර් මස නිළධාරීන් 103 දෙනෙකුගේ මාසික වැටුපෙන් සියයට 40 සීමාව ඉක්මවා ණය වාරික අඩු කර තිබුණි. | | 40% කට වැඩි නොවන ලෙස තත්ත්වය පාලනය කර ඇති අතර 2017 වර්ෂයට පසු ලබාදුන් ණය සඳහා 40% සීමාවට යටත්ව අඩු කිරීම් සිදු කර ඇත. |
| (ii) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | --------------------------- | | | |
| | මුදල් රෙගුලාසි 104, 109 | 2018 වර්ෂය තුළ සිදුවී තිබුණු වාහන අනතුරු 13 ක අලාභයන්වල එකතුව රු.1,611,376 ක් වූ අතර, එම අනතුරු සඳහා මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, නියමිත කාලවකවානු තුළ පොදු 283, 284 සහ 285 මගින් පිළියෙල කළ වාර්තාවල පිටපත්, විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වේ. | 2019 වර්ෂයේ සිට නියමිත පරිදි මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි. |
| | මුදල් රෙගුලාසි 804(1)(2) | පාර්ලිමේන්තු සංකීර්ණය තුළ පිහිටි ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයට භාණ්ඩ 90 ක්ද, විපක්ෂනායක කාර්යාලයට භාණ්ඩ 181 ක්ද, සභානායක කාර්යාලයට භාණ්ඩ 123 ක්ද ලෙස එකතුව භාණ්ඩ 304 ක් ලබාදී තිබූ නමුත් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ජේදයේ සඳහන් කරුණුවල මූලික අන්තර්ගතය හා එකඟවෙමි. |

| | | | |
|---|---|---|---|
| | මුදල් රෙගුලාසි ප්‍රකාරව එම කාර්යාලවල ඉන්වෙන්ට්‍රි ගත කල හැකිවක පරිදි පැවරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (iii) **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**<br>**--------------------------**<br>2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය හා සබැඳි 2018 දෙසැම්බර් 07 දිනැති අංක PS/SP/SB/21/2018 දරන චක්‍රලේඛය | මෙම චක්‍රලේඛ විධිවිධාන නොසලකා අවස්ථා 3 කදී කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා රු.942,559 ක වියදමක් දරා තිබුණි | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | PS/SP/SB/21/2018 දරන චක්‍රලේඛය නිකුත් වි ඇත්තේ දෙසැම්බර් 07 වෙනි දිනය. පුහුණු වැඩ සටහන් පවත්වා ඇත්තේ ඊට පෙර දිනයන්හිදීය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 වියදම් කළමනාකරණය**

**------------------------**

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම,ප්‍රතිපාදන මාරු කිරිම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ----------- | ----------------------------------- |
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු රු.803,450,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.115,757,623 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, එය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් 88 ත් අතර පරාසයක ප්‍රතිශතයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම, වාර්ෂික අයවැය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය. |
| (ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි | ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය. |

| | | | |
|---|---|---|---|
| | රු.494,650,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.428,895,566 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, එය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් 98 ත් අතර පරාසයක ප්‍රතිශතයක් වී තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | |
| (ඇ) | මූලධන වත්කම් අත්පත්කර ගැනීම් සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු වැය විෂයය 05 ක, ප්‍රතිපාදන රු.77,650,000 ක්ද, ඉතිරිවීම් රු.35,169,702 ක් ද වී තිබූ අතර එම ඉතිරිවීම් ප්‍රමාණය සහ එයට මූල්‍ය ප්‍රකාශනයන්හී දක්වා තිබූ හේතු පිළිබඳව සලකා බැලීමේදී පාර්ලිමේන්තුව විසින් මූලධන වත්කම් අත්පත්කර ගැනීම්වලට අදාලව අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව ප්‍රතිපාදන සලසාගෙන තිබූ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | විසර්ජන ගිණුමෙහි සීමිත ඉඩකඩ හේතුවෙන් විවිධ හේතූන් දැක්වීමට හැකියාවක් නොමැති වීම. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | -------------------------------------- |
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/**2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය අනුව**,** සටහන් අංක iii යටතේ වන බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර එලෙස වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන(iii) යටතේ දක්වා තිබුණු බැදීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් | අදාල පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් අදාළ අංශවලින් ප්‍රමාද වී එවා ඇති නිසා බැරකම්වලට ඇතුළත් කිරීමට ප්‍රමාද වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකල යුතු වුවත්, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් නොවන රු.36,862,264 ක පුනරාවර්තන වියදම් 2019 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | නොකළ යුතු වේ. | |
| (ආ) | මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාරව ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැදිය නොහැකි වුවද (මුදල් රෙගුලාසි 94 (ii) ප්‍රකාරව සැපයීම් හා සේවා හැර) ආයතනය විසින් වැය විෂයයන් 04 ක ඉතිරිවීම් ඉක්මවා රු.2,114,557 ක බැරකම් වලට බැදී තිබුණි. | මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාරව ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැදිය නොහැකිය. | බැරකම්වලට බැදිය නොහැකි වුවද ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැදී ඇත්තේ අදාළ සේවා හා සැපයුම් අත්‍යාවශ්‍ය හා හදිසි ඒවා වූ බැවිනි. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

----------------

**3.1.1 (අ) පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීම**

----------------------------------

2018 වර්ෂය තුළ 08 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් 77 ක් පවත්වා තිබූ අතර එම රැස්වීම් 77 න් එක් රැස්වීමක් සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 25 කට වඩා අඩුවෙන් සහභාගීවී තිබුණු අතර, රැස්වීම් වාර 06 ක් සඳහා ගරු මන්ත්‍රීවරුන් 200 කට වඩා වැඩියෙන් සහභාගී වී තිබුණි. තවද රැස්වීම් 04 ක් විනාඩි 05ත් 26 ත් ඇතුළතදී හා රැස්වීම් 03 ක් විනාඩි 38ත් 56 ත් ඇතුළතදී අවසන් වී තිබුණි.

**(ආ) පනත් කෙටුම්පත් සම්මත කිරීම**

----------------------------------

2018 වර්ෂය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ පනත් කෙටුම්පත් 39 කින් 35 ක් පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබුණු අතර, ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 06 ක් පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබුණි.

(ඇ) **රාජ්‍ය ගිණුම් කාරක සභාව**
**-----------------------------**

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2018 වර්ෂය තුළ ආයතන 18 ක් කාරක සභාව හමුවට කැඳවා විමර්ශන 20 ක් හා විශේෂිත කරුණු පිළිබඳව විමර්ශන 04 ක් පවත්වා තිබුණි. රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විමර්ශනයට භාජනය කල ආයතන ඇතුළත් ප්‍රධාන වාර්තාවක් 2018 ජුනි 19 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

(ඈ) **පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**
**--------------------------------------**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2018 වර්ෂයේදී ආයතන 32 ක කාර්යසාධනය සහ වර්තමාන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා කාරක සභා රැස්වීම් පවත්වා තිබු අතර විමර්ශනය කරන ලද ආයතන සම්බන්ධව වාර්තාවක් 2018 අගෝස්තු මස 21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

(ඉ) **මහජන පෙත්සම් කාරක සභාව**
**---------------------------------**

2018 වර්ෂය තුළ කාරක සභාවට ඉදිරිපත් කර තිබූ පෙත්සම් ගණන 621 ක් වූ අතර ස්ථාවර නියෝගවලට අනුකූල නොවීම මත කාරක සභා කාර්යාංශය විසින් භාර නොගත් පෙත්සම් ගණන 239 ක් විය. වර්ෂය තුළ රැස්වීම් වාර 19 ක් පවත්වා එයින් පෙත්සම් 382 ක් සලකා බලා තිබුණි. එයින් පෙත්සම් ගොනු 92 ක් අවසන් කර පෙත්සම්කරුවන් 05 ක් සඳහා සහන ලබා දී තිබුණි.

**3.2 සැලැසුම් කිරීම**
**----------------**

**3.2.1 ක්‍රියාකාරී සැලැස්ම**
**--------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------------------ |
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2018 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් ඉටුකළ යුතු කාර්යභාර්යන් ඇතුළත්ව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද, එම සැලැස්ම වර්ෂය ආරම්භ වීමට ප්‍රථම තොරතුරු ලබාගෙන සැලසුම් කර නොතිබුණි. තවද එම සැලැස්ම අනුමත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළයුතු වේ. | 2018 වර්ෂය ආරම්භ වන විටත් ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කර පැවති අතර, එහි අරමුණු අනුව නියමිත පරිදි ක්‍රියාත්මක කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණේ 2018 ජුලි 20 දින බැවින් 2018 මුල් අර්ධ වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්මක් මත කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | සමාලෝචනය, නියාමනය හා අධීක්ෂණය කිරීම තුළින් ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධනය හා අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කරගෙන තිබේද යන්න ප්‍රමාණවත් අයුරින් තහවුරු කර ගෙන නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධනය හා අපේක්ෂිත ප්‍රතිඵල ලගා කරගෙන තිබේද යන්න ප්‍රමාණවත් අයුරින් තහවුරු කර ගතයුතු වේ. | පාර්ලිමේන්තුවේ සහ එහි කමිටුවල ක්‍රියාකාරීත්වය එදිනෙදා අවශ්‍යතාවයන්ට අනුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබයි. ඊට අනුරූපීව පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ කටයුතුද වෙනස් වේ. එබැවින් පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයේ සැලසුම් කළ පරිදි ක්‍රියාවට නැංවීම අපහසු කාර්යයකි. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින්, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගතිය පරීක්ෂා කිරීමට විගණනයේදී නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගතිය පරීක්ෂා කළයුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදු කරන ලද කාර්යයන් සහ අනපේක්ෂිතව සිදු කළ කාර්යයන් කාර්යසාධක වාර්තාවේ ඇතුළත් කර ඇත. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාර්යයන් සඳහා වෙන්කල මුළු ඇස්තමේන්තු පිරිවැය රු.645,850,000 තුළ ඇතුළත් ඇස්තමේන්තු පිරිවැය රු.294,641,000 ක් වූ කාර්යයන් 12 ක් සමාලෝචිත වර්ෂයේදී ඉටු කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට සහ සැලැස්ම අනුව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට වග බලා ගතයුතු වේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සඳහා බලපා ඇති හේතූන් 2019.05.31 දිනට අනුව දක්වා ඇත. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර තිබුණු රු.167,000,000 ක ප්‍රසම්පාදන කාර්යයන් 03 ක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කිරීමට යෝජිතව තිබුණද එම වර්ෂය තුළ අවසන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට වග බලා ගතයුතු වේ. | එක් එක් ප්‍රසම්පාදන කාර්යය ප්‍රමාදවීමට බලපෑ හේතු දක්වා ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පාර්ලිමේන්තුවට අයත් ගොවිජන මන්දිරය පිහිටා ඇති ඉඩම සහ ශ්‍රාවස්ථි මන්දිරය පිහිටා ඇති ඉඩම්වල අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | පාර්ලිමේන්තුවට අයත් ඉඩම්වල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | ගොවිජන මන්දිරය පිහිටා ඇති ඉඩම හා ගොඩනැගිලි හා ශ්‍රාවස්ථි මන්දිරය පිහිටා ඇති ඉඩම හා ගොඩනැගිලි සඳහා ඉඩම් වල අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා එම වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 සැප්තැම්බර් 30 දිනදීය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කාර්ය බහුලත්වය හා ආවරණය කිරීමට ඇති වපසරිය වැඩි නිසා අවසන් කිරීමට නොහැකි වුවත්, 2019 ජුලි 15 දිනයට පෙර වාර්තාව ලබාදීමට කටයුතු කර ඇත. |
| (ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2017 මැයි 04 දින නිකුත් කර ඇති අංක 02/2017 දරන | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | තොග සමීක්ෂණය සඳහා පත්කල මණ්ඩලය වාර්තාව අවසන් කොට භාර දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව, පාඨකයන්ගේ පරිහරණය සඳහා පුස්තකාලවලට අත්පත් කර ගන්නා ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඇතුළත් පුස්තකාල ද්‍රව්‍ය, සම්බන්ධයෙන් වාර්ෂික තොග සමීක්ෂණද අනිවාර්යයෙන් පැවැත්විය යුතුය. එසේ වුවද, 2018 වර්ෂය සඳහා පුස්තකාල පොත් සමීක්ෂණ පවත්වා නොතිබුණි. | | |
| (ඇ) | පාර්ලිමේන්තුව විසින් අවසන්වරට සිදුකල භාණ්ඩ සමීක්ෂණවලට (2014 සහ 2017 වර්ෂවල) අදාල වාර්තා පරීක්ෂාවේදී විපක්ෂ නායක කාර්යාලයට ලබාදී තිබුණු භාණ්ඩ ඒකක 184 ක ඌනතාවයක් පැවතුණි. | භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ජේදයේ සඳහන් කරුණුවල මූලික අන්තර්ගතය හා එකඟවෙමි. |

## 3.6 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 142 දෙනෙකු පුහුණුකිරීමට සැලසුම් කර තිබුණු වැඩමුළු 02 ක් සඳහා නිලධාරීන් 46 දෙනෙකු සහභාගි නොවීම නිසා ඔවුන් වෙනුවෙන් නිවාඩු නිකේතන වෙනුවෙන් දරා තිබූ රු.153,499 ක මුදලක් සහ එම නිලධාරීන් වෙනුවෙන් මිලදී ගෙන තිබුණු ඇඳුම් සඳහා දරන ලද රු.34,320 ක මුදලක් ලෙස එකතුව රු.187,819 ක් අනාර්ථික වී තිබුණි. | සැලසුම් කල පරිදි කටයුතු කිරීමට වග බලා ගතයුතු වේ. | එක් පුහුණු වැඩමුළුවක් සඳහා දෙදිනකට 100 දෙනෙකු සඳහා පහසුකම් සැලැස් වීය. පිළිගත හැකි හේතුන් මත එම වැඩ සටහනට 29 දෙනෙකු සහභාගී නොවිය. අනෙක් වැඩමුළුව සඳහා නොපැමිණි පිරිසෙන් සහභාගී නොවීමට හේතුව ලිඛිතව ලබා ගන්නා ලදී. |

## 3.7 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) රු.13,329,732 ක් වැය කර 2008 නොවැම්බර් 05 දින පාර්ලිමේන්තු පොලීසිය සඳහා සංවෘත ආරක්ෂණ රූපවාහිනී පද්ධතියක් ස්ථාපිත කර තිබුණු නමුත්, ආරම්භයේ සිටම එම පද්ධතියේ සිදුවී තිබුණු අක්‍රියවීම් නිවැරදි කර, පද්ධතිය පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන්, වසර 07 කට පසු එනම් 2015 අප්‍රේල් 29 දින වන විට නව පද්ධතියක් ස්ථාපිත කිරීමට යෝජනා කර තිබුණි. ඒ අනුව නව පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු.මිලියන 159 ක ඇස්තමේන්තුගත වියදමකට 2018 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) සහ (ඇ) ඡේද ප්‍රකාරව, උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීමේදී ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සලසා ගැනීම, නිසි කලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුක්තව ප්‍රසම්පාදන කටයුතු කිරීම සහ කඩිනමින් වැඩ ඉටුකරවා ගැනීමද කළයුතු වේ. | අඩුපාඩු සහ දෝෂ තත්වයන් සම්බන්ධව කොන්ත්‍රාත් සමාගම දැනුවත් කළ අතර, එම ආයතන මගින් පරීක්ෂා කිරීමෙන් පසු ඉක්මණින් අළුත්වැඩියා කටයුතු සිදු කරන බව පවසා සිටියද, ප්‍රමාද වීම හේතුවෙන් 2019 ජනවාරි 15 ඉදිරිපත් කළ වාර්තාවට අනුව, ආයතනය වෙත දැන්වීමෙන් අනතුරුව අවස්ථා කිහිපයකදී අඩුපාඩු සම්පූර්ණ කිරීම සිදු විය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණු නමුත්, 2008 වර්ෂයේදී ස්ථාපිත කරන ලද පද්ධතියේ බොහෝ අඩුපාඩු තිබියදී, එම පද්ධතිය සපයන ලද ආයතනයටම, 2019 වර්ෂයේදී මිලදී ගැනීමට අපේක්ෂිත සී.සී.ටී.වී. පද්ධතියේ කොන්ත්‍රාත්තුවද, රු. මිලියන 116.5 කට 2019 අප්‍රේල් 10 දින ප්‍රදානය කර තිබුණි.2008 වර්ෂයේදී රු.13,329,732 ක වියදමින් ස්ථාපනය කරන ලද සී.සී.ටී.වී පද්ධතියේ පැවති දුර්වලතා සහ ප්‍රසම්පාදන තීරණ ගැනීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ දුර්වලතා පහත පරිදි විය. | | |
| (ආ) | සී.සී.ටී.වී පද්ධතියේ සවිකිරීම් නිම කර පාර්ලිමේන්තුවට භාර දෙන අවස්ථාවේදී පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමකින් තොරව, රඳවා ගැනීමේ මුදල හැර ඉතිරි රු.12,663,245 ක මුදල කොන්ත්‍රාත්කරු වෙත 2008 දෙසැම්බර් 02 දින ගෙවීම. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2008 නොවැම්බර් මස 05 වන දින පද්ධතිය පාර්ලිමේන්තුව වෙත භාර ගන්නා අවස්ථාවේ පද්ධතියේ සියළු සවිකිරීම් සහ ක්‍රියාකාරීත්වය නිසි පරිදි සිදු වූ අතර, පද්ධතියට අදාල උපාංග පාර්ලිමේන්තු පොලීසිය වෙත භාරදීම සිදු විය. ඒ අනුව රඳවා ගැනීමේ මුදල හැර පද්ධතිය ස්ථාපනය කිරීමට අදාල ගාස්තු ගෙවීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2009 ජනවාරි මස සිට දෝෂ සහිත වී තිබුණු ජයන්තිපුර ස්ථාපනය කර තිබෙන විචල්‍ය කැමරාව අලුත්වැඩියාව සිදු කිරීමෙන් පසු ගෙවීම් සිදු කළයුතු බවට නිර්දේශ කර තිබියදී, එම අලුත්වැඩියාව සිදු කිරීමකින් තොරව සහ පද්ධතියේ සාර්ථකත්වය පිළිබඳව නොසලකා, කොන්ත්‍රාත්කරු වෙත රු.666,487 ක රඳවුම් මුදල් නිදහස් කිරීම. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | නව විචල්‍ය කැමරාවක් ජයන්තිපුර අදාල ස්ථානයට ඉක්මණින් සවිකරන බවට හේලීස් ආයතනය මගින් සහතික කිරීමෙන් පසු මුදලින් සියයට පනහක් එනම්, රු.333,243.30 ක් 2010 මැයි 10 දින නිදහස් කිරීම. හේලීස් ආයතනය මගින් බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීමෙන් පසු ඉතිරි සියයට පනහක මුදල වන රු.333,243.30 නිදහස් කර ඇත. 2010 ජුනි 30 වන දින උසස් තාක්ෂණයෙන් යුත් නව කැමරාවක් හේලීස් ආයතනය මගින් අදාල ස්ථානයට සවිකිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | මෙම පද්ධතිය | රජයේ ප්‍රසම්පාදන | පද්ධතිය සවි කිරීමෙන් පසු එහි නිසි |

| | | | |
|---|---|---|---|
| | පාර්ලිමේන්තුවට භාරදීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.3 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව ඒත්තු ගැන්වීමේ පරීක්ෂණයක් සිදුකර නොතිබුණු බැවින්, ආරම්භයේදීම දෝෂ හඳුනාගැනීමේ අවස්ථාව සහ දෝෂ සහිත අයිතම මාරු කර ගැනීමේ අවස්ථාවද මග හැරී තිබුණි. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ක්‍රියාකාරිත්වය සම්බන්ධව පරීක්ෂා කිරීමෙන් පසු එම උපාංග පාර්ලිමේන්තු පොලීසියට භාරදීමට කටයුතු කළ අතර, පද්ධතියේ පසුව ඇති වූ දෝෂ සහිත තත්ත්වයන් අළුත්වැඩියා කිරීම් හා අයිතමයන් මාරු කිරීම් වගකීම් කාලයට යටත්ව මුදල් ගෙවීමකින් තොරව අදාල ආයතනය මගින් සිදු කර ගන්නා ලදී. |
| (ඉ) | පද්ධතිය භාර දී මාස 07 ක් ඉකුත් වීමටත් පෙර 2009 මැයි 22 දින පද්ධතියේ පළමු කැමරා ක්‍රියාවිරහිතවීම සිදුවී තිබුණු අතර, සී.සී.ටී.වී. පද්ධතියේ අඩුපාඩු හා අක්‍රියවීම් හේතුවෙන් පද්ධතිය භාර දී වසරක් ඇතුළත අවස්ථා 27 කදී අලුත්වැඩියාවන් සිදු කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | නව පද්ධතියක වුවද, විවිධ හේතු මත තාක්ෂණික දෝෂ ඇතිවිය හැක. ඉහත පරිදි ආනාවරණ කාලය තුළ මුදල් ගෙවීමකින් තොරව, එම දෝෂ නිවැරදි කර ගැනීමේ හැකියාව පවතින අතර, පද්ධතියේ අළුත්වැඩියාවන් කිහිපයක් එසේ සිදු කර ගන්නා ලදී. |
| (ඊ) | සී.සී.ටී.වී. පද්ධතියේ අක්‍රියවීම් හා අඩුපාඩු සම්බන්ධව වරින්වර කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැනුම් දී තිබුණු නමුත්, වගකීම් කාලය තුළ පද්ධතිය නිවැරදි කර ගෙන නොතිබුණු අතර, පද්ධතිය ස්ථාපනය කර භාරදී තිබුණු 2008 නොවැම්බර් 05 දින සිට 2015 වර්ෂය දක්වා වරින් වර එකතුව රු.1,757,793 ක වටිනා නව කැමරා හා උපාංග කොන්ත්‍රාත්කරුගෙන් මිලදී ගෙන සවි කර තිබුණි. 2014 අප්‍රේල් 04 දින සිට 2017 මාර්තු 07 දින දක්වා සී.සී.ටී.වී. කැමරා 04 ක් ඇතුළු උපාංග 10 ක් අලුත්වැඩියා සඳහා කොන්ත්‍රාත්කරු | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | සියළු උපකරණ පාර්ලිමේන්තුවට නැවත භාර දෙන ලෙස කිහිපවිටක් සිහි කැඳවීම් සහිතව සැපයුම්කරුට දන්වා ඇත. මේ වන විට එම කටයුතු සිදුකෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | වෙත යවා තිබුණු නමුත්, ඒවා අලුත්වැඩියා කර 2019 පෙබරවාරි 15 දින වන විටත් ආපසු ලබා ගෙන නොතිබුණි. | | |
| (උ) | 2008 ට පෙර පැවති වසර 10 කට වඩා පැරණි සී.සී.ටී.වී. පද්ධතිය සඳහා භාවිතා කළ රැහැන්, නව පද්ධතිය සඳහා භාවිතා කිරීමට හෝ ඉවත් කිරීම සඳහා අවස්ථාව ලබාදීම හේතුවෙන්, කොන්ත්‍රාත්කරු විසින් නව පද්ධතිය සඳහා පැරණි රැහැන්ම යොදා ගත්තේද, පැරණි රැහැන් යොදා ගත්තේ නම් ඊට පෙර කොන්ත්‍රාත්කරු විසින් එම පැරණි රැහැන් නව පද්ධතිය සඳහා යෝග්‍ය බවට පරීක්ෂාවක් සිදු කළේද යන්න තහවුරු කර ගෙන නොතිබුණු බැවින්, පද්ධතිය ස්ථාපනය ආරම්භයේ සිටම කැමරා අක්‍රියවීම් සිදුවූයේ පැරණි රැහැන් යොදා ගැනීම හේතුවෙන්ද යන්න හෝ පරීක්ෂා කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | සෝදිසි කැමරා ස්ථාන 28 ක් සහිත පෙර පැවති පද්ධතියට අයත් ප්‍රධාන ගොඩනැගිල්ල තුළ පැවති හොඳ තත්ත්වයේ පැවති රැහැන් නව පද්ධතිය ස්ථාපනය කිරීමේදී භාවිතයට ගැණුනු අතර, සෝද්සි කැමරා 41 ක් සඳහා නව පද්ධතියේ අමතර සියළු කැමරා සඳහා නව රැහැන් භාවිතා කරන ලදී. |
| (ඌ) | කොන්ත්‍රාත්කරු විසින් වසර 10 ක් පුරා අමතර කොටස් වෙළඳපලේ පවතින බවට සහතික වී තිබුණු නමුත්, 2015 වර්ෂය වන විට අලුත්වැඩියා සඳහා අමතර කොටස් ලබා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා දීර්ඝ කාලයක් ලබා ගැනීම සහ සමහර අලුත්වැඩියාවන් කොන්ත්‍රාත්කරු විසින් සිදු නොකිරීම වැනි ගැටළුකාරී තත්ත්වයන් පැවතීම නිසා | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පවතින පද්ධතියේ පවතින තාක්ෂණික දෝෂ හා ඒ අනුව ආරක්ෂක විමර්ශණයට ඇතිවන අපහසුතා සැලකිල්ලට ගෙන, පාර්ලිමේන්තු සංකීර්ණයේ වැඩි ස්ථාන කිහිපයක් ආවරණය වන හා මේ වන විට ක්ෂේත්‍රයේ පවතින දියුණු තාක්ෂණික තත්ත්ව යටතේ ඇති පූර්ණ ඩිජිටල් ආරක්ෂක කැමරා පද්ධතියක් සවිකිරීමට පාර්ලිමේන්තුව මගින් කටයුතු සිදුකෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | පවතින පද්ධතිය වෙනුවට නව පද්ධතියක් ස්ථාපිත කිරීමට 2015 අප්‍රේල් 29 දින යෝජනා කර තිබුණි. | | |
| (එ) | 2012 පෙබරවාරි 01 දින සිට 2019 පෙබරවාරි 15 දින දක්වාම ජයන්තිපුර ආරක්ෂක කැමරා පද්ධතියේ කැමරා 02 ක් අක්‍රියව පැවතුණු නමුත්, අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මුල් අවස්ථාවේ යුද හමුදාව මගින් ප්‍රතිපූර්ණය කිරීමේ එකඟතාව මත සැපයුම්කරු විසින් රැහැන් සන්ධිකර අළුත්වැඩියා සඳහා රු.96,717.63 මුදලක ඇස්තමේන්තු ඉදිරිපත් කළ අතර, පසුව අළුත්වැඩියා කටයුතු පාර්ලිමේන්තුව මගින් සිදු කිරීමට තීරණය වූ අතර, නැවතත් නව ඇස්තමේන්තු කැඳවීමට කළ අතර, ඒ සඳහා රු.666,600 ක මුදලක ඇස්තමේන්තුවක් සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලදී. ඉහත කටයුතු සිදු කිරීම යුද හමුදා ඉදි කිරීම් කටයුතු නිමවන තෙක් අත්හිටුවන ලදී. |
| (ඒ) | 2017 වර්ෂයේදී රු.103,248,943 ක වටිනාකමැති පාර්ලිමේන්තු සභා ගර්භයේ මයික්‍රෆෝන් සවිකිරීමේ කොන්ත්‍රාත්තුවද, රු.මිලියන 116.5 ක වටිනාකමැති පාර්ලිමේන්තු පොලීසිය සඳහා ස්ථාපිත කිරීමට නියමිත නව සී.සී.ටී.වී.පද්ධතියද 2019 අප්‍රේල් 10 දින මෙම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබුණු නමුත්, එම කොන්ත්‍රාත්තු පිරිනැමීමට පෙර, කොන්ත්‍රාත්කරු විසින් 2008 වර්ෂයේදී රු.13,329,732 ක වියදමින් ස්ථාපනය කරන ලද සී.සී.ටී.වී. පද්ධතියේ පැවති ගැටළු සම්බන්ධයෙන් පරීක්ෂාවකට ලක් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පාර්ලිමේන්තු සභාගර්භයේ මයික්‍රොෆෝන් සපයා සවිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වන ටෙන්ඩර් මණ්ඩලය විසින් **Hayleys Industrial Solutions** සමාගමේ සුළු අඩුපාඩුකම් ඇති බව අවධානයට ලක් කර ඇති නමුදු ලද ටෙන්ඩර්පත් අනුව එම සමාගමට ටෙන්ඩර් ලබා නොදීමට තරම් එම අඩුපාඩු හේතු සාධක නොවන බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණි. |
| (ඔ) | පොලිස් සී.සී.ටී.වී. පද්ධතිය වෙනුවෙන් ලැබී තිබුණු Apple Mack Book Pro ලැප්ටොප් පරිගණකය, | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | **Apple Mack Book Pro** ලැප්ටොප් පරිගණනක පද්ධතියේ දුරස්ථ පාලක පරිගණකයක් ලෙස භාවිතා කිරීම පිණිස සම්බන්ධීකරණ ඉංජිනේරු කාර්යාලයේ |

2008 නොවැම්බර් 11 දින ඉංජිනේරු අංශය විසින් පාර්ලිමේන්තු පොලීසියට භාර නොදී, ඒ වෙනුවට 2009 අගෝස්තු 17 දින පාර්ලිමේන්තු සැපයුම් අංශයේ ගබඩාවෙන් HP Compaq Dx2810 පරිගණකයක් හා එයට සම්බන්ධ උපාංග පාර්ලිමේන්තු පොලීසියට භාරදී තිබුණි. එසේ වුවද, පාර්ලිමේන්තු පොලීසියේ ඉන්වෙන්ට්‍රි ගත කර තිබුණු සී.සී.ටී.වී. පද්ධතිය වෙනුවෙන් ලැබී තිබුණු Apple Mack Book Pro ලැප්ටොප් පරිගණකය, 2019 පෙබරවාරි 15 දින දක්වාම පාර්ලිමේන්තු පොලීසිය වෙත භාරදී නොතිබුණි.

රඳවා තබන ලදී.

| | | | |
|---|---|---|---|
| (ඕ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මද, ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර ඒ අනුව වර්ෂය තුළ ප්‍රසම්පාදනයන් සිදු කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කටයුතු කළ යුතු වුවත්, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පාර්ලිමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | රටේ එදිනෙදා පවතින තත්වයන් අනුව පාර්ලිමේන්තුවේ සහ එහි කමිටුවල ක්‍රියාකාරීත්වය වෙනස් වීම, ලැබෙන සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය, වාර්ෂිකව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම පවා විවිධ හේතූන් නිසා සංශෝධනය කිරීමට සිදු වීම, භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම සහ සැලසුම් කල යෝජනා ද එම වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම යනාදිය අනුව ප්‍රසම්පාදන සැලැස්ම වසර 3 ක් සඳහා පිළියෙල කිරීම ඉතා අපහසුය. |
| (ඖ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 සහ 4.2.3 ප්‍රකාරව, එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු කාලක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන පියවර හා කාල නිර්ණය කිරීම සිදුකර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එවැනි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ක) | 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි සංශෝධන ලෙස ඇතුළත් කර නොතිබුණ කථානායක නිල නිවසේ එළිමහන් ලාම්පු කණු සවිකිරීම සඳහා වූ ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට සහ සැලැස්ම අනුව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට වග බලා ගතයුතු වේ. | 2017 වර්ෂයේ එක් එක් අංශ විසින් ඉල්ලා තිබූ යෝජනාවලින් 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන සැලැස්ම සකස් කරන ලදී. එහෙත්, ගරු කථානායකතුමාගේ කාර්යාලය විසින් පසුව කළ ඉල්ලීමකට අනුව පසුව ඇතිවූ අවශ්‍යතාවයක් මත නව යෝජනාවක් වශයෙන් එම |

| | | |
|---|---|---|
| සිදුකර ඒ වෙනුවෙන් රු.1,655,080 ක මුදලක් වැය කර තිබුණි. | | යෝජනාව ක්‍රියාත්මක කිරීමට සිදු විය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය විෂයය සඳහා රු.මි 36.46 ක් වැය කර තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 930 ක් වූ අතර එදිනට පුරප්පාඩු 101 ක් හා අතිරික්ත 06 ක් විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වේ. | 2018 දෙසැම්බර් වන විට කාර්ය මණ්ඩලයේ මුළු පුරප්පාඩු 101 ක් පැවතී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් සඳහා රු.3,723,250 ක මුදලක් වැය කර පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 477 දෙනෙකු පුහුණු කර තිබූ අතර එහිදී උපයෝජනය වෙන් කල මුළු ප්‍රතිපාදනයෙන් සියයට 74 ක් වී තිබුණි. | සැලසුම් කල පරිදි කටයුතු කිරීමට වග බලා ගතයුතු වේ. | 2018 වර්ෂය තුළදී කාර්ය මණ්ඩලයේ 331 දෙනෙකු පුහුණු කිරීමට සැලැසුම් කර තිබුණු අතර, ඒ සඳහා රු.5,000,000 ක් වෙන් කර තිබුණි. සැලැසුමට අනුව වැඩි පිරිසකට පුහුණුව ලබා දීම සඳහා අමතර ප්‍රතිපාදන ලබා නොගත් අතරබව අවධාරණය කරමි. කෙසේ වෙතත් ඉදිරියේදී අනුමත සැලැසුම අනුවම කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සිදු කිරීමට උත්සහ කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි. |